# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1869/31 – 2014 ජූලි 02 වැනි බදාදා – 2014.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: අයිආර්/21/09/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්

ජාතික සේවක සංගමය, අංක. 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, අංක. 77, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 06, ඩබ්. ඒ. සිල්වා මාවත, නො. 181/1, 503 හි ටී. ඊ. සාන්තරාජන් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ජූනි මස 10 වැනි දින,
කොළඹ දී ය.


1A – G 019824 – 100 (2014/07)

*සැ.යු.– මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: අයිආර්/21/09/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

ජාතික සේවක සංගමය, අංක. 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය, අංක. 77, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය විසින් එහි සේවයේ යොදවා සිටින සේවකයින් සම්බන්ධව 2010.01.01 දින සිට ක්‍රියාත්මක කරන ලද විනය ක්‍රියාපටිපාටිය මගින් දඬුවම් ලබාදීමේ ක්‍රමය හේතුවෙන් එම සේවකයින්ට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන්ට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 12 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.
07 – 492

---

මගේ අංකය: IR/15/18/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්

කේ. නවරත්න රාජා මයා, අංක. 27/16, තංගල්ල පාර, සමගිපුර, හම්බන්තොට.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ඩිස්ට්ලරිස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී., අංක. 110, නොරිස් කැනල් පාර, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වේයන්ගොඩ, පත්තලගෙදර, මොරටුවත්ත, අංක. 114සී, පී. දනන්සූරිය මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකය: IR/15/18/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

කේ. නවරත්න රාජා මයා, අංක. 27/16, තංගල්ල පාර, සමගිපුර, හම්බන්තොට.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ඩිස්ට්ලරිස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී., අංක. 110, නොරිස් කැනල් පාර, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

ඩිස්ටිලරිස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී. අම්බලන්තොට තොග වෙළඳ සැලේ ආරක්ෂක නියාමක ලෙස සේවය කල කේ. නවරත්න රාජා මහතාට 2004 වසරේ සිට 2010 වසර දක්වා අතිකාල දීමනා නොගෙවීමෙන් යම් අසාධාරණයක් සිදුවීද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.
07 - 493

---

මගේ අංකය: IR/15/13/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

යූ. එස්. එස්. කේ. රොද්‍රිගෝ මයා, අංක 153, දුම්රිය මාවත, පන්සල පාර, මහරගම.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1 හි පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ජූනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/13/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

යූ. එස්. එස්. කේ. රොද්‍රිගෝ මයා, අංක 153, දුම්රිය මාවත, පන්සල පාර, මහරගම.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි ගිනි හා ප්‍රවේසම් අංශයේ සී - 1 ශ්‍රේණියේ නායක ගිනිභට ලෙස සේවය කරන යූ. එස්. එස්. කේ.

රොද්‍රිගෝ මහතා 2011.09.14 වැනි දින නිවාඩු අයදුම් කළ අවස්ථාවේ දී ඒ සඳහා වැටුප් රහිත නිවාඩු ලබාදීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවූයේ ද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද?" යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මැයි මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 494

---

මගේ අංකය: IR/10/51/2012.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයෙ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2013 මාර්තු මස 11 වැනි දින අංක 1801/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013 පෙබරවාරි මස 22 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශ්වයක් වශයෙන්

එම්. එන්. ප්‍රනාන්දු මයා, අංක 162/1, දම්පේ පල්ලිය වත්ත, පිළියන්දල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ලංකා විදුලි පුද්ගලික සමාගම, අංක 411, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03.

අතර පවත්නා 2013 පෙබරවාරි මස 13 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. විරිතමුල්ල මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2013 පෙබරවාරි මස 22 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 ජූනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

07 – 495

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.